## ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව

## කොළඹ දිස්ත්‍රික්කය

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 31 උන ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 ජූලි 02 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 1.2 මතය

මෙම වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

ගිණුම් වල දක්නට තිබූ ගිණුම් දෝෂ, ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් වශයෙන් අවස්ථා හා අගයයන් යටතේ පහත වගුවෙහි දැක්වේ.

| | ගිණුම් වලට බලපෑම | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් | | වියදම් | | වත්කම් | | වගකීම් | |
| | අවස්ථා ගණන | අගය | අවස්ථා ගණන | අගය | අවස්ථා ගණන | අගය | අවස්ථා ගණන | අගය |
| | | රු. '000 | | රු. '000 | | රු. '000 | | රු. '000 |
| (අ)ගිණම්වල වැඩියෙන් දැක්වීම | - | - | 01 | 58,298 | 01 | 891 | - | - |
| (ආ)ගිණුම්වල අඩුවෙන් දැක්වීම | 02 | 3,348 | 01 | 2,999 | 01 | 5,352 | - | - |
| (ඇ)ගිණුම්වලින් අත්හැරීම් | 02 | 23,642 | - | - | 01 | 143 | 01 | 13,877 |
| (ඈ) වෙනත් | - | - | 01 | 21 | - | - | - | - |

1.3.2 **නොසැසදෙන පාලන ගිණුම්**

ගිණුම් විෂයයන් 14 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු. 267,806,162 ක් වූ අතර, උපයෝගී ලේඛණ / වාර්තා අනුව එම ගිණුම් ශේෂයන්ගේ එකතුව රු. 310,404,361 ක් විය.

1.3.3 **නිරවුල් නොකරන ලද ගිණුම්**

ගිණුම් විෂයන් 06කට අදාලව එකතු වටිනාකම රු. 2,151,594 ක් වූ ගිණුම් ශේෂ වර්ෂ 05 කට අධික කාලයක් තුල නිරවුල් නොකර ඉදිරියට ගෙන එමින් තිබෙන අතර ඉකුත් වර්ෂ වල මාගේ වාර්තා වලින් මේ පිළිබඳව පෙන්වා දී තිබනද ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

1.3.4 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

(අ) **පිළිතුරු නොලත් විගණන විමසුම්**

2011 ජුනි 30 දින වන විට විගණන විමසුම් 14කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබූ අතර, එකී විමසුම්වලට භාජනය වූ ගනුදෙනුවල වටිනාකම රු. 162,660,855 ක් විය.

(ආ) **තොරතුරු ඉදිරිපත් නොකිරීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 91,134,525 ක් ව ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 **අනුකූල නොවීම්**

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් ආදිය යොමුව** | **අනුකූල නෙවීම්** |
|---|---|
| **(අ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මු.රෙ 110 | අලාභ හා හානි පිළිබඳ ලේඛණයක් පවත්වා නොතිබුණි. |
| (ii) මු.රෙ 134(2) හා 2009 ජූනි 09 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/2009(1) | සෑම වර්ෂයකම ජනවාරි 31 වන දිනට අභ්‍යන්තර විගණන අංශයෙන් අභ්‍යන්තර විගණිත වැඩ සටහන් පිළියෙල කල යුතු අතර, එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවද එසේ කර නොතිබුණි. |
| (iii)මු.රෙ 570, 571 හා 572 | රු.5,973,244 ක කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (iv) මු.රෙ. 702 (3) | සභාව විසින් අත්සන් කරන ලද කොන්ත්‍රාත්තුවල පිටපත් විගණකාධිපතිට ඉදිරිපත් කර නොතිබුණි. |
| **ආ) 2010මාර්තු 10 දිනැති අංකPF/R/2/2/3/5 (4)දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය** | මහා නගර සභාව සඳහා සංයුක්ත සැලැස්මක් හා ක්‍රියාකාර සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 50,657,244 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 260,975,938 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

පහත සඳහන් මූල්‍ය පාලන අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2010 දෙසැම්බර් 31 දිනට බැංකු ජංගම ගිණුම්වල මුදල් පොත අනුව රු. 6,910,767 ක ශේෂයක් පැවතියද , එකී මුදලන් අතිරික්ත මුදල් ප්‍රමාණයක් ආයෝජනය කිරීම කෙරෙහි වගකිව යුතු නිළධාරීන්ගේ අවධානය යොමු වී නොතිබුනි.

(ආ) නිකුත් කළ නමුත් මාස 06 ඉක්මවා ගෙවීම සඳහා ඉදිරිපත් නොකල රු. 1,614,956 ක් වූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) වටිනාකම රු. 110,861 ක් වූ අහරු චෙක්පත් 14 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 189 හා 486 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

නගරාධිපති විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|---|
| | **ආදායම් විෂයය** | **ඇස්තමේන්තුගත** | **තථ්‍ය** | **දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය** | **ඇස්තමේන්තුගත** | **තථ්‍ය** | **දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය** |
| | | රු. **'000** | රු. **'000** | රු. **'000** | රු. **'000** | රු. **'000** | රු. **'000** |
| (i) | වරිපනම් හා බදු | 146,250 | 153,972 | 114,719 | 117,200 | 151,788 | 106,996 |
| (ii) | බදු කුලී | 20,885 | 18,860 | 22,506 | 20,296 | 15,640 | 22,713 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 4,101 | 3,839 | 6,723 | 5,201 | 4,015 | 6,993 |
| (iv) | වෙනත් ආදායම් | 149,180 | 104,880 | - | 138,895 | 262,246 | - |

ඉදිරිපත් කර ඇති සංඛ්‍යා ගිණුම් සමඟ නොසැසඳෙන බව විගණනයේදී නිරීක්ෂණය විය.

### 2.3.2 වරිපනම් බදු

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) සභා බල ප්‍රදේශයේ සමාලෝචිත වර්ෂය සඳහා දේපල හිමියන් 47,619ක් වූ අතර 2010 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු. 95,158,941ක් ලෙස වාර්තා වී තිබුණි.

(ආ) හිඟ වරිපනම් බදු එකතු කිරීම සඳහා නගර සභා බල ප්‍රදේශය තුළ වරිපනම් කොට්ඨාශ 10 සඳහා නිලධාරීන් 10 දෙනෙකු යොදවා තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ දේපල තහනම්

වරෙන්තු නියෝග යටතේ වර්ෂයේ අවසානයට රු. 82,742,455 ක් අය කර ගැනීමටවරෙන්තු නියෝග නිකුත් කර තිබුණි. රු. 49.511,479ක් පමණක් අයකරගෙන තිබීම මත එය වරෙන්තු කල මුදලින් 60%ක් විය.

(ඇ) දීමනා ගෙවීමේදී චෙක්පත් උපලබ්ධි වූ පසු දීමනා ගණනය කල යුතු වුවත් 2009 වර්ෂයේදී එකතු කල වරිපනම් බදු මුදලින් රු. 93,332ක වටිනාකමට අහරු වී තිබූ චෙක්පත් සඳහා රු.9,333ක දීමනා ගෙවා තිබුණි.

(ඇ ) දේපල තහනම් කිරීමේ නිලධාරීන් දිනපතා එකතු කරන ලද මුදල් සෑම සදුදා සහ සිකුරාදා දිනකම කාර්යාලයේ තැන්පත් කල යුතු අතර එකතු කල මුදල රු. 5,000 ඉක්මවන්නේ නම් වහාම ඊළඟ දිනයේදී මුදල් තැන්පත් කල යුතු වේ. ඉහත කොන්දේසියට අනුකූල නොවෙමින් අංක 4,7සහ10 යන කොට්ඨාශ වල දේපල තහනම් නිලධාරීන් රු. 5,000 ට වැඩි මුදල් දින 8ත් 35ත් අතර කාලයක් රදවා ගෙන තිබූ අවස්ථා 13 ක් නිරීක්ෂණය විය.

2.3.3 **වෙළඳ බලපත්‍ර**
---------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) වෙළඳ බලපත්‍ර ඉල්ලුම් කර ඇති ව්‍යාපාර ස්ථාන 1043 ක් වූ අතර එම බලපත්‍ර ලබා දීමට මාස 7-10 දක්වා කාලයක් ප්‍රමාදවී තිබුණි. විගණන දිනය වූ 2010 ඔක්තෝම්බර් 29 දින වන විට වෙළඳ බලපත්‍ර සහතික 79 ක් පමණක් නිකුත් කර තිබුණි. ප්‍රමාදවීම් පිළබඳව වගකිව යුතු නිලධාරීන්ගේ අවධානය යොමු වී නොතිබුණු අතර ව්‍යාපාර 964 ක් පමණ වෙළඳ බලපත්‍ර ලබා ගැනීමකින් තොරව බල ප්‍රදේශය තුල ව්‍යාපාර පවත්වාගෙන යන බව නීරීක්ෂණය විය.

(ආ) වෙළඳ බලපත්‍ර ලබා දීමේ දී අදාල ව්‍යාපාර මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ පරීක්ෂාවට ලක් වූයේ ද යන්න තහවුරු කර ගත හැකි ලිඛිත ලියවිලි නොතිබුණි.

2.3.4 **කඩකුලි ආදායම්**
-------------------

2010 දෙසැම්බර් 31 දින වන විට හිඟ කඩකුලී රු. 18,853,250 ක් සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) කඩ කුලී ගිවිසුම් කොන්දේසි අංක 1 ප්‍රකාරව මාසක කුලිය අදාල මාසයේ 10 වෙනි දින හෝ එදිනට පෙර ගෙවිය යුතු වුවත් මේ සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ගේ අවධානය යොමු වී නොතිබුණි.

(ආ) කඩ කුලී ගිවිසුම් කොන්දේසි අංක 2 ප්‍රකාරව තුන් මසකට අධික කාලයක් කඩකුලී නොගෙවා සිටින බදුකරුවන්ගේ ගිවිසුම අවලංගු කර වෙළඳ අයිතියද අහිමි කළ යුතු වුවත් මේ සම්බන්ධයෙන් වගකිව යුතු නිළධාරීන්ගේ අවධානය යොමු වී නොතිබුණි.

(ඇ) වැලිකඩ ප්ලාසා බිම් මහලේ අංක :12 කඩ කාමරය ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියෙන් බැහැරව අවම ප්‍රසම්පාදන වටිනාකම හා මාසික කුලිය ප්‍රතිශෝධනය නොකර පැරණි මිලටම පැවරීම නිසා සභා අරමුදලට පාඩු සිදුවී තිබුණි.

## 2.4 **වියදම් ව්‍යුහය**

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **පුනරාවර්තන වියදම්** | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 243,522 | 233,591 | 9,931 | 274,856 | 233,421 | 41,435 |
| අනෙකුත් | 217,159 | 213,739 | 3,420 | 210,662 | 204,017 | 6,645 |
| උප එකතුව | 460,681 | 447,330 | 13,351 | 485,518 | 437,438 | 48,080 |
| ප්‍රාග්ධන වියදම | 559,961 | 146,841 | 413,120 | 565,863 | 264,227 | 301,636 |
| මුළු එකතුව | 1,020,642 | 594,171 | 426,471 | 1,051,381 | 701,665 | 349,716 |

## 2.5 අධිභාර

මහා නගර සභා ආඥා පනතේ (252 වන අධිකාරය) 226 (1) වගන්තියේ විධිවිධාන යටතේ වගකිව යුතු අයවලුන්ට එරෙහිව මරිසින් පනවන ලද අධිභාර අනුව 2010 දෙසැම්බර් 31 දිනට අය කර ගැනීමට තිබුණ අධිභාරවල අගය රු. 25,550,166 ක් විය.

## 2.6 මානව සම්පත් කළමනාකරණය

**අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 12 | 10 |
| ද්විතියික | 134 | 93 |
| ප්‍රාථමික | 804 | 727 |

## 2.7 වත්කම් කලමනාකරණය

### 2.7.1 ලැබිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු. 220,328,503 ක් වූ අතර, කාල විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබුණි.

### 2.7.2 අය වීමට ඇති සේවක ණය

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂ වල එකතුව රු. 89,683,574ක් වූ අතර මාරු වී ගිය, විශ්‍රාම ගිය, සේවය හැර ගිය හා හඳුනාගත නොහැකි හිඟ ණය ශේෂ රු. 3,681,160ක් ඇතුලත් හිඟ ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබුණි.

### 2.7.3 අචල ජංගම වත්කම්

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 02ක කාලයක් ඉක්මවා අවලව පවතින අක්‍රිය මුදල් ශේෂවල අගය රු. 183,598ක් විය.

**2.7.4 සමීක්ෂණය නොකල වත්කම්**

භෞතික පරීක්ෂණ/ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් තහවුරු නොවූ 2010 දෙසැම්බර් 31 දිනට පොත් අගය මත ගණන් බැලූ අතැති තොගවල වටිනාකම රු. 18,470,644 ක් විය.

**2.8 ප්‍රමාණවත් අධිකාර් බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

**2.8.1 හිග ආදායම් කපා හැරීම**

වරිපනම් බදු හා බදු සම්බන්ධයෙන් අය කර ගත නොහැකි සේ සැලකෙන මුදලක් සභාවේ යෝජනා සම්මතයකින් අත්හැර දමනු ලැබිය හැකි වුවත් එම මුදල් රු. 1,000 ඉක්ම වන්නේ නම් මහා නගර සභා ආඥා පනතෙ (252 වන අධිකාරය) 266 (අ) වගන්තියේ විධිවිධාන අනුව විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියට යටත් විය යුතුය. එසේ වුවද පහත පරිදි රු. 1,000 ඉක්ම වු හිඟ ආදායම් අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව සභා සම්මතයකින් කපා හැර තිබුණි.

| | රු. |
|---|---|
| වරිපනම් බදු | 4,582,382 |
| වෙනත් කුලී | 156,065 |
| හිඟ හිටි ජල ගාස්තු | 35,955 |
| හිඟ හිටි විදුලි ගාස්තු | 7,689,594 |

**2.9 කොන්ත්‍රාත් පාලනය**

(අ) **චන්ද්‍රා ද සිල්වා ක්‍රීඩාංගනය ඉදිකිරීම**

චන්ද්‍රා ද සිල්වා ක්‍රීඩාංගනය ඉදිකිරීම් සම්බන්ධයෙන් වු කොන්ත්‍රාත්තුව අනුව ඉදිකිරීම් සමාගම විසින් අවසන් බිල්පත්‍රයට සභාව මුදල් නොගෙවීම් හේතුකොට ගෙන බේරුම්කරණ නඩුවක් සභාවට එරෙහිව 2008 ජූලි මස ගොනු කර තිබුණි. බේරුම්කරණ නඩුව සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) චන්ද්‍රා ද සිල්වා ක්‍රීඩාංගනය ඉදිකිරීම් සම්බන්ධ උපදේශණ ආයතනය ලෙස කටයුතු කල ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය සමඟ සභාව ඇති කර ගත් ගිවිසුමේ අංක : 3.7 කොන්දේසිය අනුව උපදේශණ ආයතනය ඕනෑම විධානයක් කිරීමට පෙර එහි ප්‍රතිඵලයක් ලෙස සභාවට අතිරේක වියදමක් දැරීමට සිදුවන හෝ ඇස්තමේන්තු මුදල තුල සිදුකරන වියදමක් වුවත් වහාම සභාවට දැනුම් දිය යුතු වුවද, ගිවිසුමට පටහැනිව ඇස්තමේන්තු වියදම අභිබවා කර තිබූ රු. 8,206,977ක වියදම සම්බන්ධයෙන් සභාවේ පූර්ව අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ii) සභාව විසින් ඉදිකිරීම් සමාගම සමඟ ඇති කරගත් ගිවිසුමේ අංක : 10 කොන්දේසිය පරිදි අනුමත ප්‍රතිඵලය ලැබෙන තුරු සිදු කරනු ලබන නැවත නැවත බිම සකස්කිරීම සඳහා අතිරේක දීමනාවක් ලබා ගැනීමට හිමිකමක් නොමැති වුවත් කුණු කසල ඉවත් කිරීමට, තුනී කිරීමට, තැලීමට හා වැසීමට ඇස්තමේන්තු මුදල ඉක්මවා බිල් ඉදිරිපත් කර තිබුණි. බිල්පත් ගෙවීමේදී එක් එක් අයිතමයන් සම්බන්ධ ඉදිරිපත් වූ වියදම්, ඇස්තමේන්තු මුදල සමඟ සසඳා ඉක්මවීම් සම්බන්ධයෙන් උපදේශන ආයතනයෙන් විමසීම් කර නොතිබුණි.

(iii) කාර්ය සාධන ඇගයීම් කමිටු වලදී ද මේ සම්බන්ධයෙන් විමසීම් කර නොතිබූ අතර සභාව වෙනුවෙන් සහභාගී වූ වගකිව යුතු නිලධාරින්ගේ අවධානය මේ සම්බන්ධයෙන් ප්‍රමාණවත් පරිදි යොමු වී නොතිබුණි. ඇගයීම් කමිටු රැස්වීම් සඳහා නාගරික ගණකාධිකාරී නාගරික ඉංජිනේරුවරයා ද සහභාගී වී තිබුණේ රැස්වීම් 02කට පමණ.

(iv) 2007 ජූලි 17 දින චන්ද්‍රා ද සිල්වා ක්‍රීඩාංගනය ඉදිකර සභාවට භාර දෙන අවස්ථාවේදී සභාව වෙනුවෙන් නාගරික කොමසාරිස්වරයා හා නාගරික ඉංජිනේරුවරයා සහභාගී වී තිබුණු අතර එදිනද අඩුපාඩු නිරීක්ෂණය කර නොතිබුණි.

(v) බේරුම්කරන නඩුවේදී සභාව විසින් ගෙවීමට තිබූ මුදල වන රු. 8,206,977ක් හා බේරුම්කරණ තීන්දුව ලැබුණු දිනය වූ 2010 දෙසැම්බර් 10 දින තෙක් ඒ මත ප්‍රමාද පොලිය වූ රු. 5,670,280 ක් වශයෙන් එකතුව රු. 13,877,258 ක් ඉදිකිරීම් සමාගමට ගෙවන ලෙස තීරණය කර තිබුණි.

**(ආ) බැද්දගාන ආදාහනාගාරය අළුත්වැඩියාව**

බැද්දගාන ආදාහනාගාරයේ අළුත්වැඩියාව වෙනුවෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙ 4.3 වගන්තිය අනුව පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණි. 8.9.2 වගන්තිය ප්‍රකාර ව කර්මාන්තය සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුමකට එළඹ නොතිබුණු අතර 5.4.4 වගන්තියේ විධිවිධාන වලට පටහැනිව කර්මාන්තය ආරම්භ කිරීම වෙනුවෙන් අත්තිකාරම 50% ක් ගෙවා තිබුණි.

2.10 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

(අ) **දියවන්නා යොවුන් උද්‍යානය**

මහා නගර සභාව විසන් දියවන්නා යොවුන් උද්‍යානය සහ බෝට්ටු අංගනය පවත්වාගෙන යාම සඳහා 2002 දෙසැම්බර් 02 දින පුද්ගලික සමාගමක් සමඟ ගිවිසුමකට එළඹ තිබූ අතර එකී ගිවිසුම 2007 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වී තිබුණි. ගිවිසුම් කාලසීමාවේදී ගිවිසුමේ කොන්දේසි කඩ කිරීම් හා බදු මුදල් අය කර ගැනම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) ගිවිසුමේ අංක 03 කොන්දේසිය අනුව පෙර වර්ෂයේ ලැබෙන ලාභයෙන් 22% කට සමාන මුදලක් නගර සභාවට ගෙවිය යුතු වුවත් එවැනි මුදලක් සභාවට ගෙවා නොතිබුණි.

(ii) ඒ ඒ වර්ෂවල ගැසට් පත්‍රය මගින් ප්‍රකාශිත දැන්වීම් පුවරු ගාස්තු අනුව දැන්වීම් සඳහා ගාස්තු සභාව විසින් අයකරගෙන නොතිබුණි.

(iii) ගිවිසුමේ අංක 19 කොන්දේසිය අනුව ගිවිසුම් කොන්දේසි කඩ කල විට ගිවිසුම අවලංගු කල යුතු වුවද ගිවිසුම් කාල සීමාව තුල අවස්ථා 21කදී ගිවිසුමේ කොන්දේසි කඩකර තිබුණද, ගිවිසුම අවලංගු කිරීමට කටයුතු කර නොතිබුණි.

(iv) ගිවිසුමේ අංක 20 කොන්දේසියට පටහැනිව වෙනත් ව්‍යාපාරික ආයතන 13ක් ව්‍යාපාරික කටයුතු පවත්වා තිබුණි.

(v) ගිවිසුමේ අංක 22 කොන්දේසිය පරිදි ඉදිරිපත් කළ යුතු ක්‍රියාන්විත බැදුම්කරය ඉදිරිපත් කර නොතිබුණි.

(vi) විනෝද බදු ආඥා පනත යටතේ යොවුන් උද්‍යානයට ඇතුලත්වීමේ ගාස්තු වලින් හා බෝට්ටු සවාරි ගාස්තු වලින් විනෝද බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(vii) 2007, 2008, 2009 හා 2010 වර්ෂ සඳහා බදුකුලී බිල්කර නොතිබුණ අතර රු. 4,868,040 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) **සභා අනුමැතියකින් තොරව ට්‍රැක්ටර් 04ක් වෙන්දේසි කිරීම**

සභා අනුමැතියකින් තොරව ට්‍රැක්ටර් 04ක් වෙන්දේසිකර රු. 820,500ක මුදලක් ලබාගෙන තිබූ අතර අදාල ගැණුම්කරුවන්ට ට්‍රැක්ටර් 04හි අයිතිය ලබානොදීම මත ට්‍රැක්ටර් 04 කිසිදු කාර්යයකට නොයොදා වර්ෂ 02කට අධික කාලයක් ගාල්කර තැබීම නිසා ඒ සඳහා රු. 3,000,000ක වන්දියක් ඉල්ලා සභා නිලධාරීන්ට විරුද්ධව නඩු පවරා තිබුණි. මෙම නඩුව වන්දි නොගෙවීම් පොරොන්දුව මත සමතයකට පත්කරගෙන තිබූ අතර සභා නිලධාරීන්ගේ නොසැලකිල්ල හේතුවෙන් නඩුගාස්තු වශයෙන් රු. 126,500ක්

සහා අරමුදලින් ගෙවා තිබුණි.තවද ට්‍රැක්ටර් 4හි අයිතිය සහා අනුමැතියෙන් තොරව පැවරීමට සිදුවී තිබුණි.

2.11 **කාර්‍ය සාධනය**

( අ ) **ඝණ අපද්‍රව්‍ය කළමණාකරණය**

(i) සභා බල ප්‍රදේශය තුළ රැස්වන කැලි කසල එකතු කිරීම හා කාණු පිරිසිදු කිරීමට රු. 129,248,000 ක් ප්‍රතිපාදනය කර තිබුණ අතර එයින් රු. 70,000,000 ක් කසල ඉවත් කිරීමේ පුද්ගලික ආයතන 02 ක් වෙත ගෙවීමට වෙන් කර තිබුණි.

(ii) විනාශ කිරීමට එකතු වන කසල වල බර කිරා බැලිය යුතු බවත් පරිසර හිතකාමී ව්‍යාපෘතියක් විය යුතු බවටත් ගිවිසුම්වල කොන්දේසි ඇතුලත් කර නොතිබුණි.

(iii) කසල එකතු කර විනාශ කිරීම සඳහා එක් ආයතනයක් සමඟ ගිවිසුම්ගත වී තිබුණු අතර ඒ සඳහා ටොන් එකකට රු. 795 ක් එම ආයතනයට ගෙවීමට එකඟ වී තිබුණි. දිනකට විනාශ කරන කසල ප්‍රමාණය ටොන් 55ක් ලෙස සලකා 2010 වර්ෂය සඳහා රු. 46,635,480 ක් ගෙවා තිබුණි. විනාශ කරනු ලබන කසල ප්‍රමාණය කිරා බැලීමක් කර නොතිබුණි.

(iv) කසල ඉවත් කිරීම සම්බන්ධ භෞතික පරීක්ෂාවේදී අතුගා පිරිසිදු නොකල මාවත් හා කසල ඉවත් නොකල ප්‍රදේශ නිරීක්ෂණය විය.

(v) සභා බල ප්‍රදේශය තුල සුපරීක්ෂකවරුන්ගේ අධීක්ෂණයට ලක් නොවූ ප්‍රදේශ හා අපවිත්‍ර කාණු නිරීක්ෂණය විය.

(vi) අපද්‍රව්‍ය කළමනාකරණය යටතේ කොම්පෝස්ට් බැරල් බෙදා දීමේ ව්‍යාපෘතියක් ආරම්භ කර තිබුණි. කොම්පෝස්ට් බැරල් ලැබීම් හා නිකුත් කිරීම් නිසි ලෙස ලේඛණගත කර නොතිබූ අතර භෞතිකව පැවති ශේෂය නිවැරදිද යන්න තහවුරු නොවීය. කොම්පෝස්ට් බැරල් බෙදා හැරීමෙන් තොරව සභා භූමිය තුල රඳවා තබා තිබුණි.

(ආ) **රෝග වැලැක්වීමේ හා රෝග සුවකිරීමේ සේවා**

සභාව විසින් මොරගස්මුල්ල හා බන්ඩාරනායකපුර සායන දෙකක් පවත්වා තිබූ අතර ඒ සඳහා නිකුත් කල ඖෂධ පිලිබඳ කරන ලද පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු අනාවරණය විය.

(i) ඖෂධ තොග පොතේ ආරම්භක ශේෂ, ලැබීම්, නිකුත් කිරීම් හා ඉතිරි තොග පිළිබඳ සටහන් කර නොතිබුණි. ඖෂධ තොග පොත අනියම් කම්කරුවෙකු විසින් පවත්වාගෙන යන බව නිරීක්ෂණය විය.

(ii) ප්‍රධාන කාර්යාලයෙන් තොග නිකුත් කිරීමේ පත්‍ර අනුව වටිනාකම රු.52,084 ක් වූ ඖෂධ නිකුත් කර තිබුණද බන්ඩාරනායකපුර සායනයේ ඒවා ලැබීම් ලෙස ඇතුලත් කර නොතිබුණි.

(iii) ඖෂධ තොග තුල කල් ඉකුත් වූ වටිනාකම රු. 31,280 ක් වූ ඖෂධ වර්ග 11ක් විය.

(iv) මාසයකට වරක් දියවැඩියා හා අධික රුධිර පීඩන රෝගීන් සඳහා සායන පැවැත්වෙන අතර වර්ෂයේ මුල් මාස 9 තුල සායන 9 ක් පවත්වා තිබුණද වෛද්‍යවරයා සහභාගී වී තිබුණේ මින් සායන 05කට පමණි. “වෛද්‍යවරයා නොවැලැක්විය හැකි හේතුවක් හැර අන් සෑම අවස්ථාවකදීම අනිවාර්‍යයෙන්ම මෙම සායනවලට සහභාගිවන බව හා පිලිගත් ක්‍රමවේදයට අනුව ප්‍රතිකාර ලබා දී ඇති බව” නගරාධිපතිවරයා 2011 ඔක්තෝබර් 04 දින මා වෙත දන්වා තිබුණ ද වෛද්‍යවරයා නොපැමිණි දිනවල අනියම් කම්කරුවන් විසින් රෝගීන් සඳහා ඖෂධ නිකුත් කර තිබු බව අනාවරණය විය.

( ඇ ) **ඩෙංගු මර්ධන විශේෂ ව්‍යාපෘතිය**

-------------------------------------

නගර සභා බල ප්‍රදේශයේ ඩෙංගු උවදුර මැඩලීම සඳහා බස්නාහිර පලාත් පාලන කොමසාරිස් වරයාගේ අනුමැතිය මත 2009 ඔක්තෝබර් 29 වන දින විශේෂ ඩෙංගු මර්ධන ව්‍යාපෘතියක් ආරම්භ කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා සේවකයින් 35 දෙනෙකු අලුතින් බඳවා ගෙන තිබුණ අතර ඔවුන් මදුරු නාශක අංශයට හා කානු පවිත්‍ර කිරීමේ අංශයට අනුයුක්ත කර තිබුනි .2010 ජනවාරි 01 වන දින සිට 2010 ජූනි 30 දින දක්වා සේවක වැටුප් සහ මදුරු නාශක රසායන ද්‍රව්‍ය සඳහා රු. 4,780,918ක මුදලක් වැය කර තිබු නමුත් නාවල පල්ලිය පටුමග, නුගේගොඩ පූර්වාරාම මාවත, උඩහමුල්ල සුහද මාවත හා නුගේගොඩ දුම්රිය පොල පාර යන මාර්ගවල කාණු පද්ධති නිසි පරිදි පවිත්‍ර කර නොතිබු බවත්, නිවාස සහ වෙළඳ ව්‍යාපාර වලින් බැහැර කරන ලද අපද්‍රව්‍ය හා ජලය

නිසා කාණු පද්ධතිය මදුරු කීටයන් සහිත ජලයෙන් පිරී තබු බවත් 2010 සැප්තැම්බර් 13 කරන ලද පරීක්ෂණයේදී නිරීක්ෂණය විය.

2.12 **අභ්‍යන්තර විගණනය**

---------------------

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සදුකර නොතිබුණි.

3. **පද්ධති හා පාලන**

------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) තොග පාලනය

(ඈ) කොන්ත්‍රාත්තු පාලනය